සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකයः

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර අක්ෂර ගණන,
    i. 12කි. ii. 10කි. iii. 16කි. iv. 18කි.

02. අනුක්ත නාම පදය තෝරන්න.
    i. තොප ii. ළමයෙක් iii. මම iv. මවක්

03. මධ්‍යම පුරුෂ ඒක වචන ක්‍රියා පදයකි.
    i. කියමු ii. කියයි iii. කියති iv. කියහි

04. "ළමයා කතන්දර පොත ශබ්ද නගා කියෙව්වේ ය" යන වාක්‍යයේ කර්ම පදය කුමක් ද?
    i. ළමයා ii. පොත iii. කතන්දර iv. ශබ්ද නගා

05. "පාපිල්ල" පමණක් යෙදුණු වචනය තෝරන්න.
    i. පාලම ii. කිරි iii. පුරුදු iv. කැවුම්

- අංක 6 සිට 8 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවල සමානාර්ථවත් පදය තිත් ඉර මත ලියන්න.

06. තාරපති - ............................................................................

07. ධවල - ............................................................................

08. කත - ............................................................................

- අංක 9 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වචනවලට විරුද්ධාර්ථවත් පදයක් බැගින් තිත් ඉර මත ලියන්න.

09. දොම්නස - ............................................................................

10. ආදරය - ............................................................................



LIVEWORKSHEETS

- අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල වගන්තියට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. මහාප්‍රාණ අක්ෂරයක් යෙදී නැති වචනය,
    i. ආරූඪ  ii. ගඟ  iii. ඡන්දය  iv. සංසයා

12. සඤ්ඤක අක්ෂරයක් සහිත වචනය,
    i. ළමයා  ii. පීඨය  iii. හොඬය  iv. නුවණ

13. "පෝරුව" යන වචනය නිර්මාණය වීමට ස්වර ව්‍යඤ්ජන නිවැරදි ව යෙදුණු පිළිතුර,
    i. ප්+ඕ+ර්+ඌ+ව්+ආ  ii. ප්+ඖ+ර්+උ+ව්+ආ  iii. ප්+ඕ+ර්+උ+ව්+අ  iv. ප්+ඕ+ර්+ඇ+ව්+අ

- අංක 14 සිට 15 තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.

14. i. ප්‍රතිඵලය  ii. මහළු මිනිසා  iii. පරීක්ෂණය  iv. විශේෂ

15. i. දර්ශනය  ii. දක්සින  iii. පෝශනය  iv. පරිසනකය

- අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.

16. ............................................................ (ගුරුවරු/ගුරුවරුන්) සිසුන් අගය කළහ.

17. කාන්තාවක් අසරණ ............................................................ (ගැහැනියක්/ගැහැනියක) රැක බලා ගන්නී ය.

18. වෙළෙන්දිය බඩු හොරට කිරා ............................................................ (විකුණුවේ ය / විකිණුවා ය.)

19. කම්කරුවෝ විශාල ගස පාරෙන් ඉවත් ................................................ (කළේ ය. / කළෝ ය.)

20. පහත වාක්‍ය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉර මත ලියන්න.

අම්මේඅනික්පාරමමත්බෝට්ටුවෙන්යනවායිශරත්කෑගැසුවේය

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

(ලකුණු 2 × 20 = 40යි)



LIVEWORKSHEETS